| ආර්ථික විද්‍යාව – I<br>Economics – I | 21 S I | විනාඩි 25 |
|---|---|---|

| විභාග අංකය : ------------------------------ | නම : ---------------------------------------------------------- |
|---|---|

**උපදෙස්**

- ❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න
- ❖ අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එම පිළිතුරට යටින් ඉරක් අඳින්න

**01. ආර්ථික පද්ධතියක් සමස්ථයක් වශයෙන් ගෙන එහි ව්‍යුහය, ක්‍රියාකාරීත්වය හා සාධනය විශ්ලේෂණය කරන ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය වනුයේ**

1. සූක්ෂම ආර්ථික විද්‍යාවයි
2. සාර්ව ආර්ථික විද්‍යාවයි
3. යථානුරූපී ආර්ථික විද්‍යාවයි
4. අභිමතානුරූපී ආර්ථික විද්‍යාවයි
5. සුභසාධන ආර්ථික විද්‍යාවයි

**02. පහත ප්‍රකාශය අතරින් ඔබට එකග විය හැකි ප්‍රකාශය හඳුනාගන්න**

1. යමක් පවතින හෝ පැවතිය හැකි ආකාරය විග්‍රහකරන ප්‍රකාශන අභිමතානුරූපී ප්‍රකාශන වේ.
2. හිගකමක් නොමැති සමාජයක සියළුම භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ.
3. අසීමිත මිනිස් උවමනාවලට සාපේක්ෂව සම්පත්වල පවතින සීමිත බව හිගකම ලෙස හැඳින්වේ
4. මිනිස් අවශ්‍යතා අසීමිත වුවද වුවමනා සීමිත වේ
5. මිලක් ගෙවීමකින් තොරව ආර්ථික භාණ්ඩ පරිභෝජනය කළ නොහැක.

**03. නිශ්පාදන සාධකයක් ලෙස භූමියට උදාහරණයක් වශයෙන් පහත සඳහන් කවරක් දැක්විය හැකිද?**

1. විල්පත්තු වනෝද්‍යානය
2. පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය
3. මොරගහකන්ද ජලාශය
4. පේරාදෙණිය උද්භිත උද්‍යානය
5. දක්ෂිණ අධිවේගී මාර්ගය

**04. පහත ප්‍රකාශන අතරින් ඔබට එකගවිය නොහැකි ප්‍රකාශය තෝරන්න**

1. ප්‍රාග්ධනය නිශ්පාදනය කරන ලද සාධකයක් වේ.
2. කර්මාන්ත ශාලා, යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍ය තොග යනාදිය මූර්ත වත්කම් ප්‍රාග්ධනයට ඇතුළත් වේ.
3. නිෂ්පාදන ක්‍රියාදාමයට යොදාගැනීමේ අපේක්ෂාවෙන් මිනිසා විසින් නිර්මාණය කරන ලද සියළු නිෂ්පාදන ආධාරක ප්‍රාග්ධනය වේ.
4. මානව ප්‍රාග්ධනය මෙන් භෞතික ප්‍රාග්ධනය ස්පර්ශ කළ නොහැකි වත්කමකි
5. ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ය.

**05. මූලයට අවතල නිශ්පාදන හැකියා මායිම් වක්‍රයක් සම්බන්ධයෙන් කවර ප්‍රකාශයක් වඩාත් සාවද්‍ය වේද?**

1. වක්‍රයේ බෑවුම තුළින් ආවස්ථික පිරිවැය නිරූපණය වේ.
2. වැඩෙන ආවස්ථික පිරිවැය තත්වයක් නිරූපණය වේ
3. එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක වලින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැපකළ යුතු ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වේ
4. එක් භාණ්ඩයක නිශ්පාදනය සමාන ඒකක වලින් අඩු කරන විට අනෙක් භාණ්ඩයේ නිශ්පාදනය වැඩි කළ හැකි ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වේ
5. එක් භාණ්ඩයක නිශ්පාදනය සමාන ඒකක වලින් අඩු කරන විට අනෙක් භාණ්ඩයේ නිශ්පාදනය වැඩි කළ හැකි ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වේ

**06. ආර්ථිකය නිශ්පාදනයේ අකාර්යක්ෂමතාවය පෙන්නුම් කරන්නේ නම්,**

1. නිෂ්පාදන ලක්ෂ්‍ය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටා තිබිය යුතුය.
2. නිෂ්පාදන ලක්ෂ්‍ය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට දකුණු පසින් පිහිටා තිබිය යුතුය.
3. නිෂ්පාදන ලක්ෂ්‍ය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට වම් පසින් පිහිටා තිබිය යුතුය.
4. එක් භාණ්ඩයක නිෂ්පාදන අඩු නොකර අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනය වැඩි කළ හැකිය.
5. ඉහත (3) හා (4) යන ප්‍රකාශ දෙකම සත්‍ය වේ

**07. රූප සටහනෙහි දැක්වෙන්නේ කිසියම් ආර්ථිකයක නිෂ්පාදන හැකියා වක්‍රයකි. ආවස්ථික පිරිවැයක් සහිතව නිමැවුමේ වෙනසක් පෙන්නුම් කරනුයේ**




1. C සිට D කරා ගමන් කිරීම තුළිනි.
2. A සිට B කරා ගමන් කිරීම තුළිනි
3. D සිට A කරා ගමන් කිරීම තුළිනි.
4. D සිට E කරා ගමන් කිරීම තුළිනි
5. C සිට B කරා ගමන් කිරීම තුළිනි.

**08. ආර්ථිකය තුළ ඉතා අවම රාජ්‍ය මැදිහත්වීමක් දක්නට ලැබෙනුයේ**

1. වෙළඳපොළ ආර්ථික පද්ධතිය තුළය.
2. විධානගත ආර්ථික පද්ධතිය තුළය
3. සමාජීය වෙළඳපොළ ආර්ථික තුළය
4. සමාජවාදී වෙළඳපොළ ආර්ථික තුළය.
5. මිශ්‍ර ආර්ථික පද්ධතිය තුළය.

**09. පහත දෑ අතුරින් මිශ්‍ර ආර්ථික පද්ධතියක කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ කවරක්ද?**

1. දේපළ පිළිබඳව පෞද්ගලික හිමිකාරීත්වයක් පැවතීම
2. මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය
3. වෙළඳපොල බලය සංකේන්ද්‍රණය වීම
4. ස්වාර්ථය පදනම් කොටගත් සානුබල පැවතීම
5. හිග සම්පත් බෙදාහැරීමට අදාළ තීරණ සම්බන්ධීකරණය කිරීමෙහිලා මිල යාන්ත්‍රණය හා ආණ්ඩුවේ විධාන යාන්ත්‍රණය යන මාධ්‍යයන් දෙකම ක්‍රියාත්මක වීම

**10. සමාජ සාධාරණත්වය දැඩිව අවධාරණය කරන වෙළඳපොල ආර්ථික පද්ධති හැඳින්විය හැක්කේ**

1. ලිබරල් වෙළඳපොල ආර්ථික ලෙසය
2. සමාජීය වෙළඳපොල ආර්ථික ලෙසය
3. සමාජවාදී වෙළඳපොල ආර්ථික ලෙසය
4. මිශ්‍ර ආර්ථික පද්ධති ලෙසය
5. පරිවර්ථන ආර්ථික ලෙසය

| | | |
|---|---|---|
| **ආර්ථික විද්‍යාව – II**<br>**Economics – II** | **21 \| S \| II** | **විනාඩි 35** |

01. ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්, ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්, ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් යනාදිය අතර වෙනස්කම් පෙන්වා දෙන්න (ලකුණු - 04 යි)

02. වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය යනුවෙන් කුමක් අදහස් වේද? මෙම නීතියට තුඩුදෙන හේතු ඔබ පැහැදිලි කරන්නේ කෙසේද ? (ලකුණු - 04 යි)

03. ආයෝජන වැඩිවීම හේතුවෙන් නිමවුමේ සිදුවන වැඩිවීමක් හා සම්පත් උපයෝජනය වැඩිවීම හේතුවෙන් නිමවුමේ සිදුවන වැඩිවීමක් ආර්ථිකය මත ඇති කරන බලපෑම නිෂ්පාදන හැකියා වක්‍ර භාවිතා කරමින් වෙන් වෙන්ව පැහැදිලි කරන්න (ලකුණු - 04 යි)

04. (අ) සම්පත් හිමිකාරීත්වය හා දේපළ අයිතිවාසිකම්වල ස්වභාවය සහ

(ආ) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට අදාළ තීරණ සම්බන්ධීකරණය කරණ යාන්ත්‍රණය යන නිර්ණායක මත ආර්ථික පද්ධති වර්ගීකරණය කළ හැක්කේ කෙසේද? (ලකුණු - **04** යි)

05. නිදහස් වෙළඳපොල ආර්ථිකයක ලාභයට අයත් කාර්යයන් මොනවාද ? (ලකුණු - **04** යි)

## මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ආර්ථික විද්‍යාව - I පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 2 | 06 | 5 |
| 02 | 3 | 07 | 2 |
| 03 | 1 | 08 | 1 |
| 04 | 4 | 09 | 5 |
| 05 | 4 | 10 | 2 |

## ආර්ථික විද්‍යාව - II

## පිළිතුරු පත්‍රය

**(01)**

- ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් යනු භාවිතය නිසා අහිමිව නොයන, ස්වාභාව ධර්මය මගින් ප්‍රතිජනනය කරන ස්වාභාවික සම්පත්ය
  උදාහරණ: මත්ස්‍ය සම්පත්, වන සම්පත්
- ප්‍රතිෂ්ඨාපන කළ නොහැකි සම්පත් යනු, භාවිතය නිසා අහිමිව යන ස්වාභාව ධර්මය මගින් ප්‍රතිජනනය නොකරන ස්වාභාවික සම්පත්ය
  උදාහරණ: පොසිල ඉන්ධන, ඛනිජ සම්පත්
- ආර්ථික සම්පත් යනු අසීමිත මිනිස් වුවමනාවලට සාපේක්ෂව සැපයුම සීමා සහිත හෝ හිඟකමක් සහිත නිෂ්පාදන සාධක වේ. හිඟකම ආර්ථික සම්පත්වල මූලික ලක්ෂණය වන බැවින් මේවාගේ ආවස්ථික පිරිවැයක්ද ඇත.
- ආර්ථික නොවන සම්පත් යනු සැපයුම අසීමිත සම්පත්ය. සැපයුම අසීමිතවීම ආර්ථික නොවන සම්පත්වල මූලික ලක්ෂණය වන බැවින් මේවාගේ ආවස්ථික පිරිවැයක් නොමැත.
  උදාහරණ: වාතය, හිරු එළිය

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හතර සඳහා ලකුණු 04යි)

(02) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකකවලින් වැඩිකරන විට ඒ වෙනුවෙන් කැපකළ යුතු අනෙක් භාණ්ඩයේ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවීම වැඩිවන ආවස්ථික පිරිවැය හෙවත් වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය ලෙස හැඳින්වේ. (ලකුණු 02යි)

වැඩිවන ආවස්ථික නීතියට බලපාන හේතු තුනකි.:

- නිෂ්පාදන සම්පත් (සාධක) සමජාතීය නොවීම. (එනම් එක් නිෂ්පාදන සාධකයක් වෙනුවට වෙනත් සාධකයක් පූර්ණ වශයෙන් ආදේශ කළ නොහැකි බව)
- විවිධ භාණ්ඩ හා සේවා නිපදවීමේදී යොදාගන්නා ශිල්ප ක්‍රම සමාන නොවනබව (එනම් වෙනස් තාක්ෂණය යොදාගන්නා බව)
- කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය සම්පත් වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙහිලා එතරම් යෝග්‍ය නොවන බව

(03) <u>ආයෝජනය වැඩිවීම නිසා නිමවුමේ සිදුවන වැඩිවීම</u>




- ආයෝජනය වැඩිවීම නිසා නිමුවුමේ සිදුවන වැඩිවීම  නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන්වීම තුළින්  නිරූපණය වේ      (ළකුණු - 02යි)

<u>සම්පත් උපයෝජනය වැඩිවීම නිසා නිමවුමේ සිදුවන වැඩිවීම</u>




සම්පත් උපයෝජනය වැඩිවීම නිසා නිමවුමේ සිදුවන වැඩිවීම වක්‍රයට වම්පසින් පිහිටි ලක්ෂ්‍යක සිට වක්‍රය දෙසට නිෂ්පාදන ලක්ෂ්‍යය විතැන්වීම තුළින් නිරූපණය වේ. (ළකුණු - 02යි)

04. (අ) සම්පත් හිමිකාරීත්වය හා දේපළ අයිතිවාසිකම්වල ස්වභාවය මත ආර්ථික පද්ධති පහත ලෙස වර්ගකළ හැක.

- ධනවාදී ආර්ථික පද්ධති
- සමාජවාදී ආර්ථික පද්ධති (ළකුණු 02යි)

(ආ) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට අදාළ තීරණ සම්බන්ධීකරණය කරණ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති පහත ලෙස වර්ග කළ හැකිය.

- වෙළඳපොල ආර්ථික පද්ධති
- විධානගත (සැලසුම්ගත) ආර්ථික පද්ධති
- සාම්ප්‍රදායික ආර්ථික පද්ධති
- මිශ්‍ර ආර්ථික පද්ධති (ළකුණු 02යි)

05. වෙළඳපොල ආර්ථික පද්ධතිවල ලාභයට අයත් කාර්යයන්

- නව්‍යතා හඳුන්වාදීම දිරිමත් කිරීම
- ආර්ථිකයේ විවිධ අංශ අතර සම්පත් බෙදීයාම කාර්යක්ෂම කිරීම
- වෙළඳපොල සංඥා සැපයීම ( ලාභ වැඩි අංශ කරා හිඟ සම්පත් ගලායාමට සැලැස්වීම)
- අවදානම් දැරීම වෙනුවෙන් ප්‍රතිලාභ සැපයීම
- රජයට බදු අයභාරය සපයන මූලාශ්‍රයක් වීම
- ආයතන ප්‍රසාරණය කිරීම සඳහා අවශ්‍ය සම්පත් සපයාදීම (නොබෙදූ ලාභ ඉහළ යාම හා සමාගම්වල කොටස් මිලට ගැනීම ධෛර්යමත්වීම)

(එක් කරුණකට ළකුණු 01 බැගින් ඕනෑම කරුණු 4ට ළකුණු 04යි)